ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාරාත්මක ප්‍රාදේශීය පාලන ක්‍රමයක් සඳහා වූ මාර්ගෝපදේශය

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය

ප්‍රාදේශීය නායිකාවන් ශක්තිමත් කිරීම තුළින් පළාත් පාලන සේවාවන් නව්‍යකරණය කිරීමේ ව්‍යාපෘතිය

FSLGA

FSLGA ACADEMY

FCM FEDERATION OF CANADIAN MUNICIPALITIES FÉDÉRATION CANADIENNE DES MUNICIPALITÉS

In partnership with Canada

පිළිගැනීම

මෙම මාර්ගෝපදේශය ප්‍රාදේශීය නායිකාවන් ශක්තිමත් කිරීම තුළින් පළාත් පාලන සේවාවන් නව්‍යකරණය කිරීමේ (PMI-WILL) ව්‍යාපෘතිය යටතේ සකස් කරන ලදී. මෙම කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී කැනේඩියානු රජය විසින් සපයන ලද මූල්‍ය සහයෝගය මෙන්ම කැනේඩියානු පළාත් පාලන සංසදයේ (FCM) තාක්ෂණික මග පෙන්වීම සහ හවුල්කාරිත්වය අපි කෘතඥපූර්වකව අගය කරමු. ශ්‍රී ලංකාවේ වඩාත් අන්තර්කරණය වූ සහ ස්ත්‍රී පුරුෂ භාවයට ප්‍රතිචාර දක්වන පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේදී ඔවුන්ගේ සහයෝගය ප්‍රශස්ත වේ.

ප්‍රවේශය

පළාත් පාලන ආයතනයන්හි සේවා සැපයීමේදී සංවේදී විය යුතු කරුණු කීපයක්වේ. මෙහිදී ප්‍රජාවේ ස්වභාවය ගැන සැලකිලිමත් විය යුතු අතර විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් කරුණක් ලෙස හඳුනාගෙන ඇත.

පළාත් පාලන ආයතනයක සේවා සැපයීමේ මූලික අඩිතාලම වන්නේ එහි අයවැයයි. ආදායම් උත්පාදනය සහ එය වියදම් කිරීමේ සැලසුම ලෙස පළාත් පාලන ආයතනයේ අයවැය සලකන අතර එහිදී ප්‍රජාවට අවශ්‍ය සේවා සැපයීමේ ක්‍රියාවලියේ දී ස්ත්‍රී පුරුෂභාවයට සංවේදී සේවා සැපයීමට විශේෂ අවධානයක් යොමුවිය යුතුය.

ස්ත්‍රී පුරුෂභාවයට සංවේදී ලෙස සේවා සැපයීමට අවශ්‍ය අයවැයක් සකස් කර ගැනීම (Gender based budgeting process) සඳහා මාර්ගෝපදේශයක් ලෙස මෙම පියවර භාවිතා කළ හැකි අතර එහි අවසන් අරමුණ වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී ප්‍රාදේශීය පාලන ක්‍රමයක් සකසා ගැනීමයි.

එම කාර්යයේ මූලික පියවර වශයෙන් පළමුව ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, ලිංගිකත්වය, එම කරුණු අතර ඇති සම්බන්ධතාවය වැනි මූලික සංකල්ප පිළිබඳව අවබෝධය වැදගත්වේ.

දෙවන පියවර ලෙස එම කරුණු පාදක කරගෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයක් සකස් කර ගනු ලබන්නේ කෙසේදැයි යන්න පැහැදිලි කරනු ලැබේ.

ප්‍රජාවේ සියලු කොටස් අන්තර්ග්‍රහණය කර ගනිමින් වඩාත් ගුණාත්මක සේවාවක් ලබාදීමේ අරමුණින් සකස් වූ මෙම මාර්ගෝපදේශ සංග්‍රහය මගින් එම ක්‍රියාවලිය සිදුකරන ආකාරය පැහැදිලි කරනු ඇත.

සකස් කිරීම

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය

පටුන

01.	හඳුන්වාදීම	05 - 06
02.	මූලික සංකල්ප හඳුනා ගනිමු	07- 10
03.	පළාත් පාලන ආයතනයේ අයවැය සම්පාදන ක්‍රියාවලියේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුගත කිරීම	11 - 18
04.	ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය සකස් කිරිම සඳහා වූ ක්‍රමෝපායන්	19 - 21
05.	පසුවිපරම් කිරීම සහ ප්‍රතිඵල ඇගයීමේ ක්‍රමවේදය	22 - 25
06.	ඇමුණුම්	26 - 32

01. හඳුන්වාදීම

1.1 පළාත් පාලන ආයතන සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාරාත්මක අයවැය සකස්කිරීමේ උපදේශන මාලාවේ භාවිතය

යම් පළාත් පාලන බල ප්‍රදේශයකට අදාල සමාජ සහ ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීමේ මූලික සැලසුම වන්නේ එහි අයවැය ප්‍රකාශයයි. එහෙත් පළාත් පාලන ආයතනයක අයවැය සකස් කිරිමේදී සමාජයේ විවිධ කණ්ඩායම්වල සුවිශේෂී අවශ්‍යතා හඳුනාගැනීමට එතරම් අවධානයක් යොමු නොවන හෙයින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාරාත්මක අයවැය සකස් කිරීම මගින් පහත දැක්වෙන කරුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවනු ඇත.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

සිය බල ප්‍රදේශයේ වාසය කරන ස්ත්‍රීන්ට, පුරුෂයන්ට හෝ සුවිශේෂී ලිංගික අනන්‍යතාවයක් ඇති පුද්ගලයන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ප්‍රතිචාර දැක්වීමට හැකිවීම. මෙහිදී කාන්තාවන් සවිබල ගැන්වීමට හැකිවීම ද විශේෂ කරුණකි.

ආර්ථික සමෘද්ධිය ඇති කිරීම

සම්පත් සම ලෙස බෙදීයාමට සැලැස්වීම මගින් ආර්ථික දුෂ්කරතා ඇති පිරිස ද සවිබල ගැන්වීම තුළින් ආර්ථික සමෘද්ධිය ඇති කල හැකිවීම.

වගවීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාරාත්මක අයවැය සකස් කිරීම මගින් පළාත් පාලන ආයතනය සමාජයේ සියලු කොටස් සඳහා වගවීමකින් කටයුතු කිරීමට පෙළඹීම.

සම්පත් සාධාරණ අයුරින් බෙදී යාම

සමාජයේ විවිධ ජනකොටස්වලට සුවිශේෂ වූ අවශ්‍යතා හඳුනාගෙන එය සපුරාලිය හැකි අයුරින් සාධාරණ ලෙස සම්පත් බෙදීමට සැලසීම සහ ඉන් ඇතිවන ප්‍රතිඵල නිසි ආකාරයෙන් පසුවිපරම් කිරීම තුළින් යම් අඩුපාඩු හෝ දියුණු කළ යුතු කරුණු හඳුනා ගැනීම. ඒවා අවම කිරීමට අවශ්‍යය පියවර ගැනීම තුළින් සැමට සාධාරණ ලෙස සේවාවන් සැපයීමට හැකිවීම.

1.2 උපදේශන මාලාවේ අරමුණ

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වූ විවිධ සංකල්ප හඳුනා ගැනීම තුළින් ඊට ප්‍රතිචාරාත්මක අයවැයක් පිළියෙල කිරීමේ ක්‍රමවේදය හඳුන්වාදීමයි. පළාත් පාලන ආයතනයක අයවැය සකස් කිරීමට අදාල ප්‍රධාන අනපනත්හි ඇතුලත් නීතිමය ප්‍රතිපාදන ද මෙම අත්පොතේ ඇමුණුමක් ලෙස සඳහන් කර ඇත.

1.3 පරිශීලනය සඳහා ඉලක්ක කණ්ඩායම

පළාත් පාලන ආයතනවල අයවැය සකස් කිරීමේ කාර්යයේ නියැලෙන නිළධාරීන්, දේශපාලන නායකත්වය සහ නියෝජිතයන්, ප්‍රථම ඉලක්ක කණ්ඩායමයි.

දෙවැනි ඉලක්ක කණ්ඩායම වන්නේ පළාත් පාලන ආයතනවල විවිධ කමිටු නියෝජනය කරන පුරවැසියන්ය. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ඇති සංකල්ප සහ එයට ප්‍රතිචාර දක්වන ක්‍රමවේද මනාලෙස අවබෝධ කර ගැනීම තුළින් ඔවුන්ට අයවැය සකස් කිරීමේ ක්‍රමවේදයට මනාලෙස දායක විය හැකිය.

02. මූලික සංකල්ප හඳුනා ගනිමු

2.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවය

ස්ත්‍රී පුරුෂ සමාජභාවය (Gender) යනු සමාජීය සහ සංස්කෘතික කරුණු පදනම්ව ගොඩනගා ඇති සංකල්පයකි. යම් සමාජයක් ස්ත්‍රීය, පුරුෂයා, පිරිමි දරුවා, සහ ගැහැණු දරුවා වෙනුවෙන් අපේක්ෂිත යම් භූමිකාවන් ගොඩනගා ඇත. මෙහිදී එම සමාජයේ පවතින සංස්කෘතික පදනම, සම්මතයන්, විශ්වාසයන්, සහ ඇදහිලි වැනි කරුණු මත පදනම්ව එක් එක් චරිත සඳහා අනන්‍යවූ හැසිරීම්, ඇවැතුම් පැවැතුම් ගොඩනැගෙයි. උදාහරණයක් ලෙස - යම් කුටුම්භයක මව සහ පියාට පැවරී ඇති රාජකාරී වෙන් වශයෙන් සමාජය ගොඩනගා ඇත. මව දරුවන් වැදීම, හැදීම සහ ඇයට හිමි අනෙකුත් සමාජ භූමිකාවන් ඉටු කළ යුතු අතර පියා බොහෝවිට ආදායම් ඉපයීම, ගෙදර ඇති කාන්තාවකට කළ නොහැකි අසීරු කාර්යයන් ඉටු කිරීමට පෙළඹෙයි. පිරිමි දරුවන් සහ ගැහැණු දරුවන්ට ද එවැනි සුවිශේෂි භූමිකාවන් ඇත. ගැහැණු දරුවකුගේ හැසිරීම, ඇඳුම, ගමන්බිමන් යාම, ආදී කරුණුවලදී පිරිමි දරුවන්ට වඩා සමාජයේ අවධානය ගැහැණු දරුවන් කෙරෙහි යොමු කර ඇති අතර යම් හෙයකින් ඔවුන් සම්මතයෙන් පිට යමක් කරයි නම් එය දැඩි ලෙස සමාජ විවේචනයට ලක්වේ.

මෙම කරුණු සංස්කෘතියෙන් සංස්කෘතියටද, එකම රටක ඇති එකම සමාජ කණ්ඩායම් අතර මෙන්ම රටින් රටට ද වෙනස්වේ. උදාහරණයක් ලෙස - එකම ජන කණ්ඩායමකට අයත් නාගරික පරිසරයක ජීවත්වන තරුණියක සහ ග්‍රාමීය පරිසරයක ජීවත්වන තරුණියකට ඇති සමාජ බලපෑම් එකිනෙකට වෙනස්ය.

බොහෝවිට මෙහිදී ස්ත්‍රීය සහ පුරුෂයා ගේ භූමිකාවන් අතර බල අසමතුලිතතාවයක් නිරීක්ෂණය කළ හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රීය අවාසි සහගත තත්වයකට පත්ව ඇති බව පෙනී යයි.

2.2 ලිංගිකත්වය

මනුෂ්‍යයන්ගේ සහ සතුන්ගේ ජීව විද්‍යාත්මක සාධක මත ලිංගිකත්වය පදනම්ව ඇත. එය මූලික වශයෙන් පදනම්ව ඇත්තේ ලිංගික අවයව, ප්‍රජනන හැකියාව, හෝමෝන සහ එහි ක්‍රියාකාරිත්වය වර්ණදේහ වැනි භෞතික සහ මානසික ස්වභාවයන් මතය.

බොහෝවිට අලුත උපන් බිළිඳෙකුගේ ලිංගික අවයව නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව එම දරුවාගේ ලිංගිකත්වය තීරණය කරයි. ඉන්පසු ඒ මත පදනම්ව එම දරුවාගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුමාන කරයි.

2.3 ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය[1]

ස්ත්‍රීය සහ පුරුෂ සමාජභාවය මත පදනම්ව වෙනස් ලෙස සැලකීමෙන් වැලකීම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලෙස සැලකේ. මෙහිදී සමානාත්මතාවය යනුවෙන් හැඳින්වෙන්නේ ස්ත්‍රී, පුරුෂ, පිරිමි දරුවන් සහ ගැහැණු දරුවන්ගේ වෙනස් අවශ්‍යතා, සීමාවන්, අභියෝග ආදිය හඳුනාගෙන එම කරුණු සැලකිල්ලට ගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා සඳහා සමාන සැලකීමක් ලබාදීමයි.

2.4 ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ ලිංගිකත්වය මත පදනම්ව අසමාන ආකාරයෙන් සැලකීම

මෙහිදී ලිංගිකත්වය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව එක් කණ්ඩායමක් අනික් කණ්ඩායමට වඩා උසස් හෝ වැඩි වරප්‍රසාද සඳහා හිමිකම් ඇති බව තහවුරු කිරීම මගින් සමාජයේ එක කොටසකට අගතියක් සිදුවිය හැකිය.

2.5 ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදීවීම [2]

කාන්තාවන්, පුරුෂයන් සහ සමාජයේ තුන්වන කණ්ඩායම් (ස්ත්‍රීයක හෝ පුරුෂයකු යැයි එක් අනන්‍යතාවකට අයත් නොවන) සතු අයිතිවාසිකම්, වගකීම් සහ භූමිකාවන් පිළිබඳව යම් සමාජ සංස්කෘතික සම්මතයන් සහ වෙනස්කම්, තේරුම් ගනිමින් සහ සැලකිල්ලට ගනිමින්, අවබෝධ කර ගැනීම. මෙහිදී ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම්ව ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට අත්දැකීමට සිදුවන වෙනස් ප්‍රතිචාර, අත්දැකීම්, අවස්ථා, සහ අභියෝග පිළිබඳව සංවේදීවීම, එය පිළිගැනීම මෙන්ම එයට ගරු කිරීම වැදගත් වේ.

[1] https://eige.europa.eu/gender-mainstreaming/glossary

[2] https://www.un-redd.org/glossary/gender-sensitive

2.6 ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාරාත්මක වීම

මින් අදහස් වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනන්‍යවූ කරුණු හඳුනාගැනීම, අවබෝධ කර ගැනීම හා ප්‍රතිපත්ති, වැඩසැලසුම්, සහ සේවාවන් ලබාදීමේදී එම අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රතිචාරාත්මක ලෙස පියවර ගැනීමයි. මෙහිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් ඇති භූමිකාවන්, අත්දැකීම්,සහ අභියෝග පිළිබඳව සැලකිලිමත්වීම වැදගත් වේ. මෙසේ සංවේදීවීමෙන් සහ නිසි ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීම තුළ ස්ත්‍රීපුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීමට හැකිවන අතර ප්‍රජාව සවිබල ගැන්වීමට ද මෙය වැදගත් සාධකයක් වේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාරාත්මක සෞඛ්‍ය සේවාවක් සැලසීමේ ක්‍රියාවලියේ දී පහත දැක්වෙන උදාහරණ සැලකිල්ලට ගත හැකිය [3]

- කාන්තාවන්ට සායන පැවැත්වීමේදී පෞද්ගලිකත්වය ආරක්ෂා වන ස්ථානයක රෝගීන් පරීක්ෂා කිරීමට පහසුකම් සැලසීම
- පිරිමි වෛද්‍යවරයෙකු සේවාව ලබා දෙන්නේ නම් ස්ත්‍රී සහායිකාවක් ද එම අවස්ථාවට සහභාගීකර ගැනීම හෝ තම පවුලේ කෙනෙකුට එම ස්ථානයේ රැඳී සිටීමට අවසර ලබාදීම
- ස්ත්‍රීන්ට සිය සායන සේවාවන් සඳහා අවශ්‍යය නම් වෛද්‍යවරියකගේ සේවාව ලබාදීමට පියවර ගැනීම
- පොදු ස්ථානවල අසුන් ගැනීමේ පහසුකම් (විශේෂයෙන්ම මුස්ලිම් කාන්තාවන් සිටී නම් ඔවුන් පිළිබඳ සංවේදී විය යුතුය)
- ළදරු සායනවලදී ළදරුවන්ට මව්කිරි ලබාදීමට ස්ථානයක් වෙන් කිරීම.
- මාතෘ සායන සඳහා ආරක්ෂාකාරී සහ පහසු ප්‍රවේශයන් සකස් කිරීම.
- තරුණ තරුණියන් සඳහා මනෝසායන ආදිය පැවැත්වීමේදී ඔවුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරිම
- සමාජ රෝග ආදිය පරීක්ෂා කිරීමේදී හා ප්‍රතිකාර කිරීමේදී එම රෝගීන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම

2.7 සමාජ ඡේදනයන් (Intersectionality)

සමාජය විවිධ පැතිකඩ ඔස්සේ ඡේදනයට ලක්ව ඇත. ආර්ථික මට්ටම්, ආගම්, විවිධ ජාතීන්, කුලය, ස්ත්‍රී පුරුෂ බව, වයස, රැකියාව, ජීවත්වන පරිසරය, විවාහය, භාෂාව ආදී වශයෙන් මේ සමාජ ඡේදනයන් නිරීක්ෂණය කළ හැකිය. එකම පුද්ගලයකු සමාජ ඡේදන කීපයකට ලක්විය හැකි අතර ඒ මත ඔහුට හෝ ඇයට සමාජයේ විවිධ ස්ථරයන් නියෝජනය කිරීමට සිදුවන ඇත. එය වාසි සහගත හෝ අවාසි සහගත බලපෑම් ද ඇති කරයි.

උදා - රාජ්‍යය ආයතනයක
දරිද්‍ර, නූගත් සහ භාෂාව නොදත් පුද්ගලයකු සේවාවක් ලබා ගැනීමට පැමිණීම
හා
වත්පොහොසත්, හා භාෂාව දන්නා පුද්ගලයෙකු සේවාවක් ලබා ගැනිමට පැමිණීම.
මේ එකිනෙකාට සේවාව සැපයීමේදී වඩාත් පහසුවෙන් සේවාව ලැබිය හැක්කේ කාටදැයි සිතන්න.

2.8 ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම (Gender Mainstreaming)

යම් ආයතනයක සේවාවක් ලබා ගැනීමේදී කාන්තාවන්ට සහ පුරුෂයන්ට වෙනස්වූ අත්දැකීම් ඇත. පළාත් පාලන ආයතනයක සංවර්ධන ක්‍රියාවලිය සහ සේවා ලබා ගැනීම යන කාර්යයන් ස්ත්‍රීන් සහ පුරුෂයන්ට සුවිශේෂ වූ ආකාරයකින් බලපායි. සියලු දෙනාටම සම ප්‍රවේශයක් සහ සම අවස්ථාවන් ලබා

[3]https://www.data4impactproject.org/

ගැනීම සඳහා, සංවර්ධන ක්‍රියාවලිය සහ සේවා ලබාදීමේ දී ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට එය වෙනස් ආකාරයෙන් බලපාන බව අවබෝධ කර ගනිමින් එම සංවර්ධන කාර්යයන් සහ සේවාවන් සැලසුම් කළ යුතුය. එවිට සම්පත් සහ අවස්ථාවන් සියලු දෙනාටම සම ප්‍රතිලාභ ලබාදෙන ආකාරයෙන් බෙදී යනු ඇත.

මින් අදහස් වන්නේ සංඛ්‍යාත්මකව එක හා සමානවීම නොව (එනම් 50:50 ආකාරයෙන් නොව) එක් එක් ප්‍රජාව සතු වෙනස්කම් සැලකිල්ලට ගනිමින් සියලුදෙනාටම එක හා සමාන ලෙස සැලකීමයි.

උදාහරණයක් ලෙස තීරණ ගැනීමේ ස්ථානයක ස්ත්‍රීන් සහ පුරුෂයන් එක හා සමාන සංඛ්‍යාවක් සිටියද ස්ත්‍රීන්ට තම අදහස් ඉදිරිපත් කිරීමට හෝ තීරණවලට බලපෑමක් කිරීමට අවකාශ නොලැබේ නම් ඔවුන්ගේ සහභාගීත්වයේ ප්‍රතිඵල අත් කර ගත නොහැකි අතර එම තීරණ සාධාරණ සහ සම තීරණ ලෙස සැලකිය නොහැකිය.

එම නිසා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරිම යනුවෙන් අදහස් කරන්නේ සංඛ්‍යාත්මකව සහභාගීත්වය නොව ක්‍රියාශීලි සහභාගීත්වයයි (active participation).

2.9 පළාත් පාලන ආයතනයේ අයවැය සම්පාදන ක්‍රියාවලියේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුගත කිරීම

පළාත් පාලන ආයතනයේ ව්‍යාපෘති සහ වැඩසටහන් සම්පාදනයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගැන පදනම්වූ කෝණයකින් එය විශ්ලේෂණය කිරීම වැදගත්ය. එය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය යන පුළුල් අරමුණ මත පදනම්විය යුතුය. අයවැය සම්පාදන පූර්ණ ක්‍රියාවලියේදීම මෙම කරුණ කෙරෙහි මනා අවධානයක් යොමු කළ යුතුය. ප්‍රතිඵල වඩාත් මැනවින් විශ්ලේෂණය කර යම් අඩුලුහුඩුකම් නිරීක්ෂණය වන්නේ නම් ඊළඟ අයවැය සම්පාදනයේදී ඒ පිළිබඳව නැවත අවධානය යොමුකර නිවැරදි කර ගත යුතුය.

03. පළාත් පාලන ආයතනයේ අයවැය සම්පාදන ක්‍රියාවලියේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුගත කිරීම

3.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අවධානය යොමු කිරීමේ ප්‍රායෝගික හා උපාය මාර්ගික අවශ්‍යතා

ප්‍රායෝගික අවශ්‍යතා සැලකිල්ලට ගැනීමේදී අවධානය යොමු කරනු ලබන්නේ භෞතික සම්පත් සහ සේවාවන් කෙරෙහිය. උපාය මාර්ගික අවශ්‍යතාවලදී සමාජයේ ආකල්ප වෙනස් කිරීමේ දිගුකාලීන ක්‍රියාදාමයක් කෙරෙහි අවධානය යාමු කරයි.

	ප්‍රායෝගික අවශ්‍යතා	උපාය මාර්ගික අවශ්‍යතා
1	කෙටි කාලීන හා කඩිනමින් ඉටුවිය යුතුයග උදා - පළාත් පාලන ආයතනයේ අයවැය සකස් කරන අවස්ථාවේ අපදාවකදී ප්‍රතිචාර දක්වන අවස්ථාවක වසංගත අවස්ථාවක ප්‍රතිචාර දක්වන විටදී	දිගු කාලීන ක්‍රියාමාර්ගයකි උදා - යම් ප්‍රජාවක ස්ත්‍රීයට ඇති කාර්යභාරයක කොටසක් පුරුෂයා විසින් ඉටු කිරීමට පෙළඹවීම - ආහාර පිළියෙල කිරීම, දරුවන් රැකබලා ගැනීම
2	එදිනෙදා අවශ්‍යතා ඉටු කිරීමේදී උදා - ප්‍රජා සුබ සාධන කටයුතු, මාතෘ සායන, මාර්ගවල විදුලි පහන්, සෞඛ්‍ය අවශ්‍යතා	කාන්තාවන්ට අඩු වරප්‍රසාද හෝ අඩු සමාජ පිළිගැනීම් ඇති අවස්ථාවන් හා සබැඳේ උදා - අධ්‍යාපනයට ඇති හිමිකම, තීරණ ගැනීමේදී ක්‍රියාශීලි සහභාගීත්වය, ජීවන තත්වය උසස් කර ගැනීම සඳහා සම්පත් ලබා ගැනීම හා පරිහරණය කිරීමට ඇති අවකාශය
3	ඉලක්කගත යෙදවුම් මගින් මෙම අවශ්‍යතා සපුරාගත හැකිය උදා- ආහාරපාන, සෞඛ්‍යය පහසුකම්, සුබසාධන කටයුතු සැපයීම	ආත්ම විශ්වාසය ගොඩනැඟීම තුළින් මෙම අවශ්‍යතා සපුරා ගත හැකිය අධ්‍යාපන අවස්ථා, දේශපාලන සහභාගීත්වය, තීරණ ගැනීමේ නිදහස සහ ක්‍රියාශීලී සහභාගීත්වය, පළාත් පාලන ආයතනවල කාන්තාවන් සඳහා උපදේශක කමිටු ස්ථාපනය සහ සිවිල් සමාජ කාන්තා සහභාගීත්වය, කාන්තා අයිතිවාසිකම් සුරැකීමේ සංවිධානවල ක්‍රියාකාරීත්වය.
4	කාන්තාවන්ගේ ජීවන මට්ටම ඉහල නැංවිය හැකිය උදා - සෞඛ්‍යය සහ සනීපාරක්ෂක පහසුකම් කාන්තාවන්ගේ ආර්ථික මට්ටම ඉහල නැංවීමේ ව්‍යාපෘති ආදිය ක්‍රියාත්මක කිරීම	සමාජයේ කාන්තාවන්ට හිමි ස්ථානය ඉහල නැංවීමට හා කාන්තාව පිළිබඳ ආකල්ප වෙනස් කර ගැනීම සඳහා දිගු කාලීනව කටයුතු කිරීම
5	කාන්තාවන් ගේ සම්ප්‍රදායික භූමිකාව හෝ සමාජ ආකල්ප සහ සබඳතා වෙනස් නොවේ	කාන්තාවන්ට බලය ලබාදීම තුළින් සමාජ සබඳතා සහ සම්ප්‍රදායික භූමිකා ක්‍රමිකව වෙනස් කළ හැකිය.

3.2 පළාත් පාලන ආයතන සඳහා ස්ත්‍රී පුරුෂභාවය සංවේදී අයවැය සකස් කිරීම

පළාත් පාලන ආයතනයක අයවැය පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ වෙසෙන ප්‍රජාව වෙනුවෙන් වාර්ෂිකව ක්‍රියාත්මක කිරීමට යෝජිත සේවාවන්, සහ වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණය ගැනීම සඳහා පාදක වන අතිශයින්ම වැදගත් ලේඛණයයි.

පළාත් පාලන ආයතන සඳහා ස්ත්‍රී පුරුෂභාවයට සංවේදී අයවැයක් සකස් කිරීම වැදගත් වන්නේ

- සියලු ජනකොටස්වල අවශ්‍යතා සහ උනන්දුව දක්වන කරුණු සැලකිල්ලට ගැනීම
- මෙහිදී කාන්තාවන්ට හෝ පුරුෂයන්ට වෙන් වශයෙන් අයවැයක් සකස් කරන්නේ නැති අතර සියලු ප්‍රතිපත්ති, වැඩසටහන් සහ සේවාවන් සියලු ජනකොටස්වල අපේක්ෂාවන්, හා උනන්දුවන කරුණු මත සංවේදීව සකස් කරනු ඇත.
- ප්‍රාදේශීය ආර්ථික කටයුතු වඩාත් උත්තේජනය කරයි - මාර්ග ආලෝක පද්ධතිය හොඳින් ක්‍රියාත්මක වන ප්‍රදේශවල කාන්තාවන්ට රාත්‍රිවන තෙක් සිය රැකියාව හෝ ව්‍යාපාරවල යෙදීමට හැකිය.
- ජාත්‍යන්තර වශයෙන් පිලිගත් සම්මුතීන්, ප්‍රතිපත්ති සහ ඉලක්ක කරා යෑමට ප්‍රාදේශීය මට්ටමේ දායකත්වය මේ තුළින් ලබා ගත හැකිය. උදා තිරසාර සංවර්ධන ඉලක්ක

3.2.1 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට සංවේදී අයවැය සකස් කිරීමෙන් අත්විය හැකි ප්‍රතිලාභ

- කඩිනමින් අවශ්‍යතා සපුරාලිය යුතු ජනකොටස් සහ ඔවුන් ලැබිය යුතු ප්‍රතිලාභ හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරිමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරිම.
- රාජ්‍ය සේවාවන් ලැබෙන පිරිස් හඳුනා ගැනීම සහ එම ක්‍රියාවලිය පසුවිපරම් කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කිරීම සහ දූෂණය අවම කිරීම.
- පාරදෘෂ්‍යභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම
- සංවර්ධන ක්‍රියාවලියේ බලපෑම් සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ප්‍රතිලාභ ප්‍රජාවට ලබාදීම පිණිස සිවිල් සමාජය සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කිරීම
- ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ජාතික සහ ජාත්‍යන්තර කැපවීම්වල ප්‍රගතිය වාර්තා කිරීම.
- උද්දේශනය (advocacy) සහ පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම
- වෙනස් ආකාරයෙන් සැලකීම, අකාර්යක්ෂමතාවය, සහ දූෂණය වැනි කරුණු සඳහා අභියෝග කිරීමට අවශ්‍ය තොරතුරු සැපයීම
- නව හෝ වෙනස් ප්‍රතිපත්ති සැකසීමට අවශ්‍ය තොරතුරු සම්පාදනය.
- මහජන නියෝජිතයන් සහ රජයේ වගවීම තහවුරු කිරීමට සහාය දැක්වීම
- දිළිඳු සහ අසරණ ජනතාවගේ අවශ්‍යතා හඳුනාගැනීමට හැකිවීම.

3.2.2 පළාත් පාලන ආයතනයේ අයවැය සැකසීමේ ක්‍රියාවලිය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව විමසා බැලීම

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී වඩාත්ම වැදගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ පදනම වන්නේ එහි අයවැය ප්‍රකාශයයි.

අයවැය සකස් කිරීමේ ක්‍රියාවලිය විමසා බැලීමේදී පහත දැක්වෙන පියවර ගැනීම වැදගත්වේ.

පියවර1
- ස්ත්‍රී පුරුෂ සමාජභාවයට බලපාන ගැටළු හඳුනාගැනීම (අවස්ථා විශ්ලේෂණය)

පියවර 2
- පදනම - තොරතුරු රැස් කිරීම

පියවර 3
- එක් එක් ක්‍රියාකාරකම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව විශ්ලේෂණය කිරීම

පියවර 4
- අදාල ක්‍රියාකාරකමට වෙන් කර ඇති ප්‍රතිපාදන ස්ත්‍රීපුරුෂ සමාජභාවී කෝණය මත පදනම්ව විශ්ලේෂණය කිරිම

පියවර 5
- සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම පිණිස අරමුණු සහ නිර්දේශ සකස් කිරීම

<u>පියවර 1 - ස්ත්‍රී පුරුෂ සමාජභාවයට බලපාන ගැටළු හඳුනාගැනීම (අවස්ථා විශ්ලේෂණය)</u>

අවස්ථා විශ්ලේෂණය යනු එක් එක් ක්ෂේත්‍රයන් නියෝජනය කරන ස්ත්‍රීන්, පුරුෂයන් ගැහැණු සහ පිරිමි දරුවන්ගේ තත්වයන් පිළිබඳව ගැඹුරින් විමසා බැලීමයි. මෙමගින් ඔවුන් අතර තිබෙන සමානාත්මතාවන් සහ විෂමතාවන් හඳුනාගත හැකි අතර ඔවුන්ට ඇති ප්‍රායෝගික අවශ්‍යතා සහ ප්‍රමුඛතාවන් හඳුනාගත හැකිය.

වෘත්තිකයන්, රැකියා විරහිත හෝ නිශ්චිත ආදායම් මාර්ග නොමැති පිරිස, ව්‍යාපාරිකයන්, තරුණ කණ්ඩායම්, වැඩිහිටි ප්‍රජාව, ශිෂ්‍යයන්, ආදී වශයෙන් යම් ව්‍යාපෘතියක අවධානය යොමු විය යුතු කණ්ඩායම් හඳුනාගත හැකිය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම පිණිස ප්‍රායෝගික සහ ක්‍රමෝපායික අවශ්‍යතාවන් හඳුනාගැනීම වැදගත්වේ. ප්‍රායෝගික අවශ්‍යතාවන් සමාජ භූමිකාවන් මත පදනම්වන අතර ක්‍රමෝපායික අවශ්‍යතා සමාජ, ආර්ථික සහ දේශපාලන තත්වයන් මත පදනම් වේ. ප්‍රායෝගික අවශ්‍යතා සපුරාලීම තුළින් ගෘහස්ථ හිංසනය වලකාලීම, සමාන රැකියා සඳහා සමාන වැටුප් ලබාදීම, සහ ලිංගික සූරාකෑම් වලකාලීම වැනි කරුණු සාක්ෂාත් කර ගත හැකිය. ක්‍රමෝපායික අවශ්‍යතා සපුරාලීම තුළ ස්ත්‍රී

පුරුෂ සමාජභාවය මත පදනම්ව ශ්‍රම විභජනය, සම්පත් සහ බලය ලබා ගැනීමට ඇති අයිතිය වැනි දිගුකාලීන අවශ්‍යතා තහවුරු කර ගත හැකිය.

ප්‍රායෝගික අවශ්‍යතා ගැන පමණක් අවධානය යොමු කිරීමෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ අසමතුලිතාවක් ඇතිවිය හැකිය. ක්‍රමෝපායික අවශ්‍යතා සපුරාලීමතුළ ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට සමාජයේ පවතින ස්ත්‍රී පුරුෂ භූමිකාවන්හි අභියෝගයන්ට මුහුණදීමට හැකි වන අතර ජීවිතය ද යම් ආකාරයකට පාලනය කර ගත හැකිය.

අදාල කණ්ඩායමක් පිළිබඳ විශ්ලේෂණය කිරීම යනු එම කණ්ඩායමට සුවිශේෂී තොරතුරු එනම් රැකියා තත්වයන්, වෘත්තීයන්, වැටුප් සහිත සහ වැටුප් රහිතව සිදු කරන සේවාවන් වැනි කරුණු පිළිබඳව විචාරශිලී ලෙස විමසා බැලීමයි. ඉලක්ක කණ්ඩායම් සමඟ සාකච්ඡා කිරීම මගින් අදාල තොරතුරු රැස් කර ගැනීම පහසු වේ.

<u>පියවර 2 - පදනම - ඔබට අදාල වැඩසටහන පිළිබඳ තොරතුරු රැස් කිරීම</u>

යම් වැඩසටහනක් පිළිබඳ තොරතුරු රැස්කිරීමට සූදානම්වන විට එම වැඩසටහනේ අරමුණ, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, ප්‍රධාන ක්‍රියාකාරකම්, අයවැය, මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ ක්‍රමවේදය, සංඛ්‍යා ලේඛන සහ දත්ත, ඉලක්ක කණ්ඩායම්, ප්‍රතිලාභීන්, ආදිය වැදගත්වේ. මෙම කරුණු තවදුරටත් විශ්ලේෂණය කිරීම මගින් අදාල වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව දළ විශ්ලේෂණයක් ලබා ගත හැකිය.

<u>පියවර 3 – වැඩසටහන්/ක්‍රියාකාරකම්/සේවාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය කෝණයකින් විශ්ලේෂණය කිරීම.</u>

පුළුල් වැඩසටහනක් විශ්ලේෂණය කිරීමේදී එහි ප්‍රධාන උප වැඩසටහන් සහ ක්‍රියාකාරකම් විශ්ලේෂණය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය කෝණයෙන් විශ්ලේෂණය කිරීම පහසුය.

- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳව පවතින අසමතුලිතතාවය සහ අභියෝග සැලකිල්ලට ගැනීම
- පොදු සේවාවන් හා වැඩසටහන්වල ප්‍රතිලාභීන් විශ්ලේෂණය කිරීම
- පොදු සේවාවන්හි හා වැඩසටහන්වල ප්‍රතිලාභීන්ගේ තෘප්තිමත්භාවය විශ්ලේෂණය කිරීම
- පොදු සේවාවන්/ වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කිරීමේදී තීරණ ගැනීමේ ක්‍රියාවලිය විශ්ලේෂණය කිරීම
- මෙම පොදු සේවාවන් සහ වැඩසටහන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට ඇති කරන බලපෑම් විශ්ලේෂණය කිරීම.

<u>පියවර 4 - පොදු සේවාවන් සහ වැඩසටහන් සඳහා අයවැය වෙන් කිරීම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය කෝණයකින් විශ්ලේෂණය කිරිම</u>

- පොදු ආදායම් සහ වියදම් විශ්ලේෂණය **ස්ත්‍රී** පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියේ ඉතාමත් වැදගත් කාර්යය යි.
- පොදු වැඩසටහන් සහ සේවාවන් ක්‍රියාත්මක කිරීමේදී **ස්ත්‍රී** සහ පුරුෂ ප්‍රතිලාභීන් වෙන් වශයෙන් හඳුනාගැනීම මගින් මෙම විශ්ලේෂණ ක්‍රියාවලිය පූර්ණ ආකාරයෙන් සහ පහසුවෙන් ඉටු කර ගැනීමට හැකියාව ලැබෙයි.

- ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට සුවිශේෂී වූ අවශ්‍යතා හඳුනාගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබේදැයි තහවුරු කර ගැනීම
- මෙම වැඩසටහන් සහ සේවාවන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවන සේවක පිරිවැය සලකා බැලීමට ද **ස්ත්‍රී** සහ පුරුෂයන් සඳහා වන පිරිවැය වෙන් වශයෙන් ගණනය කිරීම ද වැදගත්වේ.
- මෙය වාර්ෂිකව මෙන්ම සංසන්දනාත්මකව යම් කාලයක් පුරා සිදු කිරීම තුළින් **ස්ත්‍රී** පුරුෂ සමාජභාවය සංවේදී අයවැය සකස් කර ගැනීම පිළිබඳ මනා විග්‍රහයක් සිදු කළ හැකිය.

<u>පියවර 5 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම පිණිස අරමුණු සහ නිර්දේශ සකස් කිරීම</u>

- ඉලක්ක ගත වැඩසටහනේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කර ගැනීම පිණිස අයවැය ස්ත්‍රී පුරුෂ සමාජභාවී කෝණයෙන් විශ්ලේෂණය කිරීම වැදගත්වේ.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමතුලිතා නිරීක්ෂණය කළ විට එය නිවැරදි කිරීම සඳහා අරමුණු, ක්‍රියාකාරකම්, කාර්යය දර්ශක (performance indicators), සහ ප්‍රතිපාදන වෙන් කිරීම.
- මෙම නිර්දේශ මගින් සමාන ප්‍රවේශයන් (equal access), ඉලක්කගත සේවාවන් ලබාදීම, (targeting services), සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංකල්ප අනුගත කිරීම වැනි කරුණු තහවුරු කර ගත හැකිය.
- මෙම විශ්ලේෂණ මගින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කර ගැනීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය මැන බැලීමේ දර්ශක නිසි ලෙස අර්ථ නිරූපණය කළ හැකිය.
- නිර්දේශ සකස් කිරීමේදී විකල්ප නිර්දේශ ද සලකා බැලීම වැදගත්වේ.
- නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්, දෙපාර්තමේන්තු, ආයතන මෙන්ම තීරණ ගන්නා සහ අවසාන වගකීම දරණ නිලධාරීන් ද, හඳුනා ගැනීම වැදගත්වේ.

3.2.3 පළාත් පාලන ආයතනයන්හි අයවැය සකස් කිරීම

පළාත් පාලන ආයතනයන්හි මූල්‍යය කටයුතු පිළිබඳ වගකීම එම ආයතනය වෙත පැවරී ඇති අතර ඒ සඳහා සෑම පළාත් පාලන ආයතනයක්ම නීතියෙන් නියමවී ඇති පරිදි මුදල් වර්ෂයක් සඳහා අයවැය සම්පාදනය කළ යුතුවේ. පළාත් පාලන ආයතනයක මුදල් වර්ෂය ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දක්වාවේ.

පළාත් පාලන ආයතනයක මූල්‍යය සහ කාර්ය සැලසුම සහ මූල්‍ය කළමනාකරණය මෙම අයවැය මත පදනම්ව සකස් කරයි.

පළාත් පාලන ආයතනයක වාර්ෂික අයවැය එයට අදාල වර්ෂයට පෙර වර්ෂයේ සකස් කර එම වර්ෂය අවසානවීමට පෙර නිසි අයුරින් සම්මත විය යුතුය. කෙසේ වුවද සම්මත කරන ලද අයවැය අනුව කිසියම් වැය දැරීමක් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති අවස්ථාවක දී වැය ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමට හෝ අදාල වන විටක දී පරිපූරක අයවැයක් සම්මත කරගැනීම සිදුකළ හැකිය.

3.2.4 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සංවේදීව අයවැය සකස් කිරීමේදී

- අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියේ දී සෑම පියවරක්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවී කෝණයෙන් විමසා බැලීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංවේදී වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සඳහා විශේෂ වැය ශීර්ෂයක් වෙන් කිරීම
- අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියේදී ප්‍රජා අදහස් විමසීම සඳහා කාන්තාවන්, ආන්තික කණ්ඩායම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනුවෙන් උද්දේශනයේ නියැලෙන (advocacy groups) පිරිස් සහභාගී කර ගැනීම.
- අයවැයේ ඇති ප්‍රතිචාර පිළිබඳව පසුවිපරම් කිරීම සඳහා එක් එක් විෂයන්ට/ ස්ත්‍රී පුරුෂ ආදී වෙන්ව විශ්ලේෂණය කරන ලද දත්ත රැස් කර විමසා බැලීම.

- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳව සලකා බලා ඇත්තේදැ යි විමසීම සඳහා අවශ්‍යය විගණන Gender Audit ක්‍රමවේදයන් හඳුන්වාදීම.

3.2.5 පළාත් පාලන ආයතනක අයවැය සකස් කිරීමේ දින දර්ශනය

කාර්යය	ඉලක්ක දිනය	වගකීම
අයවැය ලේඛනය සැකසීම සඳහා උපදෙස් ලේඛනය නිකුත් කිරීම	අප්‍රේල් 15	නාගරික කොමසාරිස්/ නගර සභා ලේකම්/ ප්‍රාදේශීය සභා ලේකම්
යෝජිත කොට්ඨාශ කමිටු හා සභිකවරුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීම	ජූනි 30	කොට්ඨාශ කමිටු සහ සභිකවරුන්
ආදායම් සහ වියදම් පිළිබඳ ඒ ඒ අංශවල වාර්තා ඉදිරිපත් කිරීම	ජූනි 30	අංශ ප්‍රධානීන්
මූලික ඇස්තමේන්තු සකස් කිරීම	ජූලි 01	ගණකාධිකාරී/ පොත් තබන නිලධාරී/ අයවැය නිලධාරී
මුදල් කමිටුවේ උපදෙස් ලබා ගැනීම	ජූලි 31	නාගරික කොමසාරිස්/ ලේකම්
නගරාධිපති/ සභාපති සමාලෝචනය	අගෝස්තු 01	නගරාධිපති/සභාපති
අයවැය ප්‍රතිපත්ති තීරණය කිරීම සහ සභාවට ඉදිරිපත් කිරීම	අගෝස්තු 31	නගරාධිපති/සභාපති
අංශවල අයවැය ඇස්තමේන්තු සකස් කිරීම	සැප්තැම්බර් 30	අංශ ප්‍රධානීන්
අවසාන ඇස්තමේන්තු සකස් කිරීම සහ අයවැය ලේඛනය කෙටුම්පත් කිරීම	ඔක්තොම්බර් 31	ගණකාධිකාරී/ පොත් තබන නිලධාරී/ අයවැය නිලධාරී
මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව විසින් කෙටුම්පත් අයවැය ලේඛනය සළකා බැලීම	නොවැම්බර් 01	නාගරික කොමසාරිස්/ ලේකම්
අයවැය පණිවුඩය සැකසීම	නොවැම්බර් 20	නගරාධිපති/සභාපති
කෙටුම්පත් අයවැය ලේඛනය සැකසීම	නොවැම්බර් 30	නගරාධිපති/සභාපති

අවශ්‍ය වන්නේනම් කෙටුම්පත් අයවැය ලේඛනය දෙවෙනි වර ඉදිරිපත් කිරීම	දෙසැම්බර් 10	නගරාධිපති / සභාපති
අයවැය ලේඛන කෙටුම්පත අනුමත කිරීම	දෙසැම්බර් 15	සභාව

ආශ්‍රිතය: පළාත් පාලන ප්‍රතිසංස්කරණ කොමිසන් සභා වාර්තාව 1999

****

04. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය සකස් කිරිම සඳහා වූ ක්‍රමෝපායන්

4.1 ධාරිතා සංවර්ධනය

1. පුහුණු වැඩසටහන්

පළාත් පාලන ආයතනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියට අදාල නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය විශ්ලේෂණය කරන ආකාරය, අයවැය ක්‍රියාවලිය සහ සියලු සමාජකොටස් අන්තර්කරණය (social inclusivity) වැනි කරුණු පිළිබඳව නිසි අවබෝධයක් ලබාදීමට අවශ්‍ය දැනුම සහ ධාරිතාව සංවර්ධනය කිරීම.

2. ක්‍රමෝපායන් සහ තාක්ෂණික මෙවලම් (Tools) ලබාදීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය සකස් කිරීම සහ දැනුම අඛණ්ඩව ලබාදීම සඳහා අවශ්‍යය වන ක්‍රමෝපායන්, තාක්ෂණික මෙවලම් සහ අන්තර්ජාලය ආශ්‍රිතව දැනුම ලබා ගැනීමේ වැඩසටහන් ආදිය සකස් කිරීම.

3. දැනුම් හුවමාරුව

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය සාර්ථක ලෙස සකස් කිරීමේ නියැලුණ පළාත් පාලන ආයතනවල දැනුම අනෙකුත් පළාත් පාලන ආයතන වෙත ලබාදීම සඳහා දැනුම් හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

4.2 අයවැය සකස් කිරීමේ ක්‍රියාවලිය සඳහා පුරවැසි සහභාගීත්වය

1. මහජන අදහස් විමසීම

විවිධ සමාජ කොටසක් නියෝජනය කරන පුරවැසියන් ගෙන් අදහස් විමසීම සඳහා සාකච්ඡාවන් පැවැත්වීම. මෙහිදී විශේෂයෙන් කාන්තාවන් සහ වෙනත් ආන්තික කොටස් ද සම්බන්ධ කර ගැනීමට අවධානය යොමු කළ යුතුය.

2. පසුවිපරම් කිරිමේ කමිටු

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයක යෝජනා කර ඇති ව්‍යාපෘති සහ වැඩසටහන් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේදැයි විමසා බැලීම පිණිස ප්‍රජා සහභාගීත්ය සහිත පසුවිපරම් කමිටු ස්ථාපිත කළ යුතුය. මෙම කමිටුවේ නියෝජනය සඳහා එම ප්‍රදේශයේ ඇති රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනුවෙන් උද්දේශන කටයුතුවල නියැලෙන පිරිසට ආරාධනා කළ හැකිය.

3. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය සකස් කිරීම පිළිබඳය දැනුම්වත් කිරීමේ වැඩසටහන්

පුරවැසියන්, විශේෂයෙන්ම කාන්තාවන් සහ ආන්තික කණ්ඩායම් මෙම ක්‍රියාවලිය සහ එහි ප්‍රතිලාභ පිළිබඳව දැනුම්වත් කිරිමට සහ ඔවුන්ට එම ක්‍රියාවලිය දායකත්වය දැක්වීමට හැකි ආකාරය පිළිබඳව දැනුම්වත් කිරිම සඳහා වැඩසටහන් පැවැත්වීම.

4.3 අවදානම් කලමනාකරණය සහ අවම කිරීම

1. අවදානම් හඳුනා ගැනීම

මෙම ක්‍රියාවලිය සිදුකිරීමේදී මුහුණ දිය හැකි අවදානම් එනම් පළාත් පාලන ආයතනය තුළ අවශ්‍ය ධාරිතාව නොමැතිවීම, වෙනස් ක්‍රමවේදයන්ට අනුගත වීම සඳහා වූ අකමැත්ත, අවශ්‍ය සම්පත් නොමැතිවීම වැනි අභියෝගාත්මක කරුණු හඳුනාගැනීම

2. අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන්

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය සකස් කිරිමේදී ඇති විය හැකි බාධක අවම කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කළ යුතු වේ.

3. වගවීමේ යාන්ත්‍රණය

මෙම ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඒ සඳහා අදාල පාර්ශවයන්ගේ භූමිකාව සහ වගකීම් පැහැදිලිව හඳුනාගත යුතු අතර ඔවුන් ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාදිය යුතුය.

පුරවැසියන්ගේ දුක් ගැනවිලි සහ ගැටළු ආදිය පළාත් පාලන ආයතනය වෙත ඉදිරිපත් කිරිම සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතු වේ.

05. පසුවිපරම් කිරීම සහ ප්‍රතිඵල ඇගයීමේ ක්‍රමවේදය

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයක් සකස් කර එය ක්‍රියාත්මක කිරිමේදී ලබා ගන්නා ලද ප්‍රතිඵල අධීක්ෂණය සහ ඇගයීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතුවේ.

5.1 දර්ශක

1. සංඛ්‍යාත්මක දර්ශක

- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කර ගැනීම සඳහා වූ වැඩසටහන් සඳහා වාර්ෂික අයවැයෙන් වෙන් කර ඇති වැය ප්‍රතිශතය
- ලබාදී ඇති සේවාවන්ගෙන් ප්‍රතිලාභ ලබාගත් කාන්තාවන් සහ ආන්තික ප්‍රජාවේ පිරිස සංඛ්‍යාත්මකව දැක්වීම
- තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලිය ට සහභාගී වූ කාන්තාවන් සංඛ්‍යාව

2. ගුණාත්මක දර්ශක

- සාධාරණ ආකාරයෙන් සහ ආන්තික කණ්ඩයම් ආදිය අන්තර්කරණය මගින් ප්‍රතිලාභ ලබා ගත් පිරිසේ අදහස් විමසා බැලීම
- පළාත් පාලන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමානාත්මතාවය පිළිබඳව දැනට ඇති ආකල්ප වෙනස් වූ ආකාරය විමසා බැලීම

5.2. දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය

1. මූලික අධ්‍යයනය (Baseline Assessment)

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය ක්‍රියාත්මක කිරීමෙන් පසු ඇතිවන හා සංසන්දනාත්මකව අධ්‍යයනය සඳහා පැවති තත්වයන් පිළිබඳව අධ්‍යයනයක් සිදු කළ යුතුය.

2. ස්ත්‍රී පුරුෂ සහ තුන්වෙනි කණ්ඩායම වශයෙන් බල ප්‍රදේශය තුළ ජීවත්වන ප්‍රජාවේ දත්ත යාවත්කාලීන කිරීම

ඉහත කී විවිධ සමාජ කොටස්වලට සිදුවන බලපෑම් වෙන් වශයෙන් අධ්‍යයනය කිරීම සඳහා මෙම දත්ත වැදගත්වේ.

3. පාර්ශවකරුවන්ගේ ප්‍රතිචාර

ප්‍රතිලාභීන්, සිවිල් සංවිධාන සහ ප්‍රජා නායකයින්ගෙන් ක්‍රමානුකූලව සහ අඛණ්ඩව ප්‍රතිචාර ලබා ගැනීම වැදගත්වේ

5.3 ප්‍රගතිය වාර්තා කිරිමේ ක්‍රමවේදය

- වාර්ෂික වාර්තාව

  ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය සකස් කර ක්‍රියාත්මක කිරිම තුළ ලැබූ ප්‍රගතිය හා අදාල අනෙකුත් කරුණු වාර්තා කිරිම පිණිස වාර්ෂික වාර්තාවේ කොටසක් වෙන් කිරීම

- ප්‍රජාව හා සම්බන්ධවීම හා දැනුම්වත් කිරීම

මෙම ක්‍රියාවලිය තුළ අත්පත් කර ගත් ප්‍රගතිය පිළිබඳව ප්‍රජා රැස්වීම් මගින් හා මාර්ග ගත ක්‍රම මගින් (on line platforms) ප්‍රජාව දැනුම්වත් කිරීම තුළ විනිවිදභාවය තහවුරු කර ගැනීම.

5.4 ඇගයීම් ක්‍රියාවලිය

අර්ධ වාර්ෂික ඇගයුම

අර්ධ වාර්ෂිකව ඇගයීම තුළින් ක්‍රියාවලියේ අවධානය යොමුවිය යුතු කරුණු හඳුනාගෙන සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත හැකිය.

බලපෑම් ඇගයීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය සකස් කිරීම තුළින් ප්‍රජාවගේ යහපැවත්ම වෙනුවෙන් ලැබිය හැකි දිගුකාලීන බලපෑම් ඇගයීම.

සංසන්දනාත්මක විශ්ලේෂණය

එක් එක් පළාත් පාලන ආයතන ලබා ගත් ප්‍රගතිය සහ අත්දැකීම් ආදිය යහපුරුදු ලෙස විශ්ලේෂණාත්මක ලෙස ඇගයීම.

5.5 වගවීම සහ ප්‍රගතිය පිළිබඳ අධ්‍යයනය

- ස්වාධීන ඇගයීම් කමිටුවක් මගින් විගණනයක් සිදු කිරීම
- ඇගයීම් කමිටුවේ ප්‍රතිඵල අනුව තවදුරටත් දියුණු කළ යුතු කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම සහ එහි ප්‍රතිඵල පාර්ශවකරුවන් සමග බෙදා ගැනීම.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ඇගයීම සඳහා භාවිතා කළ හැකි ක්‍රමෝපාය

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය තක්සේරු කිරීමේ ක්‍රමවේදය

පළාත් පාලන ආයතනයක් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය එහි අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියේදී අනුගත කිරීම සහ සියලු පාර්ශවයන්ගේ අවශ්‍යතාවන් සලකා බැලුවේද යන්න තක්සේරු කිරීමට පහත දැක්වෙන මෙවලම භාවිතා කළ හැකිය.

භාවිතා කළ හැකි ආකාරය

එක් එක් වැඩසටහන හෝ ව්‍යාපෘතිය පහත දැක්වෙන නිර්ණායක මත පදනම්ව විශ්ලේෂණය කළ හැකිය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාරාත්මක භාවය අධ්‍යයනය සඳහා 1 සිට 5 දක්වා අගයක් ලබා දෙන්න.

තක්සේරු කිරීමේ නිර්නායක	විස්තර	ඇගයීමේ ලකුණු
ස්ත්‍රී පුරුෂ සමාජභාවය විශ්ලේෂණය කරන ලදී	කාන්තාවන්, පුරුෂයන් සහ ආන්තික කණ්ඩායම් අවශ්‍යතාවන් හඳුනාගැනීම සඳහා විශ්ලේෂණයන් සිදු කළේද?	☑ ඔව් (5)/ X නැත (0)
ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම	ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වැඩසටහන් සඳහා අයවැයෙන් කුමන ප්‍රතිශතයක් ප්‍රතිපාදන වෙන් කළේද	1 – (අවම) 5- (වැඩිම)
සහභාගීත්වය හා අදහස් විමසා බැලීම	අයවැය සකස් කිරිමේ ක්‍රියාවලියේදී කාන්තා සංවිධාන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂ දැනුම ඇති පිරිසකගෙන් අදහස් ලබා ගත්තේද?	☑ ඔව් (5)/ X නැත (0)
ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට ඇති විය හැකි බලපෑම්	සේවා සැපයීම, සම්පත් බෙදී යාම ආදී කරුණුවලදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීමට ඇති පරතරය පියවීම සඳහා අයවැය මගින් අවධානය යොමු කර තිබේද?	☑ ඔව් (5)/ X නැත (0)
පසුවිපරම සහ වගවීම	මෙම වැඩසටහන්වලින් ඇතිවන ප්‍රතිඵල විශ්ලේෂණය කිරිම සහ නිවැරදි කිරිම සඳහා අවශ්‍යය පියවර ගැනීමට ක්‍රමවේදයක් තිබේද?	☑ ඔව් (5)/ X නැත (0)

ලකුණු මත පදනම්ව පහත දැක්වෙන කරුණු තහවුරු කළ හැකිය.

20-25 ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ඉතාමත් සංවේදී අයවැයකි

15-19. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට යම්තාක් දුරට සංවේදී අයවැයකි. තවදුරටත් දියුණු කළ යුතුවේ.

15 ට අඩු - ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී නොවන අයවැයකි. කඩිනම් පියවර ගත යුතුවේ.

අයවැය තවදුරටත් දියුණු කර ගැනීම සඳහා ගත හැකි පියවර

- කාන්තා සංවිධාන සමඟ සාකච්ඡාවන් තව දුරටත් ශක්තිමත් කිරීම
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා වන ක්‍රියාකාරකම්, ව්‍යාපෘති ආදිය සඳහා අයවැයෙන් වෙන් කරන ප්‍රතිපාදන ප්‍රතිශතය වැඩි කිරිම
- පසුවිපරම් ඇගයීම සහ වගවීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම.

ඇමුණුම 1

අයවැය සම්පාදනය සඳහා අදාල නෛතික විධිවිධාන

මහා නගර සභා

නෛතික විධිවිධාන	අදාල කාර්යයන්
මහා නගර සභා ආඥා පනත 211 වගන්තිය	• වාර්ෂික අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම • සෑම වර්ෂයකදීම ඉදිරියට එළඹෙන මුදල් වර්ෂය සඳහා අයවැය සභාවට ඉදිරිපත් කළ යුතුය. • පහත කරුණු ආවරණය විය යුතුය • ලබන්නා වූ වර්ෂය සඳහා ලබා ගත හැකි ආදායම් ඇස්තමේන්තුවක් • ලබන්නා වූ වර්ෂය සඳහා මහා නගර සභාව විසින් වැය කිරීමට අපේක්ෂිත වියදම් පිළිබඳ විස්තරය • නගරාධිපතිවරයා විසින් පෙර නියම කරන ලද දිනයකදී නගරාධිපතිවරයා විසින් මහා නගර සභාව සඳහා අයවැය ඉදිරිපත් කළ යුතුවේ.
212 වගන්තිය	අයවැය ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය • නගරාධිපතිවරයා ස්ථාවර කමිටු විමසා අයවැය ලේඛනය පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. • අයවැය ලේඛණය සභාවට ඉදිරිපත් කිරීමට යටත් පිරිසෙන් දින හතක (07)කට පෙරාතුව සියලුම නාගරික සභිකවරුන් (මන්ත්‍රීන්වරුන්) අතර බෙදා හැරිය යුතුය. • අයවැය ලේඛණය සභාවට ඉදිරිපත් කිරීමට දින හතකට (07) පෙර මහජන නිරීක්ෂණය සඳහා මහා නගරසභා කාර්යාලයේ හෝ නගරාධිපතිතුමා විසින් නියම කරන ස්ථානයක විවෘතව තැබිය යුතුය. • · අයවැය පිළිබඳව රජයේ ගැසට් පත්‍රයේ හා මහා නගරසභා බල ප්‍රදේශයේ බෙදා හරිනු ලබන පුවත්පත් දෙකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක පළ කිරීම මගින් දැණුම් දිය යුතුය.
213 වගන්තිය	(iii) අයවැය මහා සභාව විසින් සලකා බැලීම • මුදල් වර්ෂයේ අවසාන මාසයේදී මහා නගරසභාවේ විශේෂ සභා රැස්වීමකදී අයවැය ලේඛණය අවසාන වශයෙන් සලකා බැලිය යුතුය.

214 වගන්තිය	පරිපූරක අයවැයක් ඉදිරිපත් කිරීම නගරාධිපතිවරයාට ඕනෑම අවස්ථාවකදී පරිපූරක අයවැයක් ඉදිරිපත් කළ හැකි අතර පරිපූරක අයවැයක් ඉදිරිපත් කිරීමට දින 07 කට පෙර එය සභිකයන් වෙත ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම එය, ගැසට් පත්‍රයක් සහ පුවත්පත් මගින් ප්‍රසිද්ධ කිරීම සහ මහජන පරීක්ෂාව සඳහා විවෘතව තැබීම ද අවශ්‍ය වේ.
2්15 වගන්තිය	සභාව විසින් අයවැය හෝ පරිපූරක අයවැය ලේඛණ සම්බන්ධයෙන් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලැබේ • සම්මත කිරීම • සංශෝධනය කිරිම • අලුතින් කරුණු එකතු කිරීම හෝ • ප්‍රතික්ෂේප කිරීම අයවැය/පරිපූරක අයවැයට අදාලව සභාව විසින් ඉදිරිපත් කරන සංශෝධන සඳහා නගරාධිපතවරයා එකඟ නොවන්නේනම් අදාල අයවැය/පරිපූරක අයවැය නැවත සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කළ යුතුය.

නගර සභා

නෛතික විධිවිධාන	අදාල කාර්යයන්

නගර සභා ආඥා පනත 178 (1) වගන්තිය	(1) වාර්ෂික අයවැය ඉදිරිපත් කිරීම
	
	• සෑම නගරසභාවකම සභාපතිවරයා විසින්ම එක් එක් වර්ෂය තුළ ඊළඟ අනුප්‍රාප්තික වර්ෂය වෙනුවෙන් අයවැයක් සකස් කර සභාවට ඉදිරිපත් කළ යුතුවේ.
	• සකස් කරන ලද අයවැය ලේඛණය සභාවට ඉදිරිපත් කළ යුත්තේ සභාපතිවරයා විසිනි.
	• නගරසභා ආඥා පනතේ 193 වගන්තිය යටතේ සකස් කරන ලද රීති මගින් හෝ සභාවේ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබූ දිනයේ හෝ ඊට පෙර දිනයකදී අයවැය ලේඛණය සභාවට ඉදිරිපත් කළ යුතුවේ.
	• පළාත් පාලන කොමසාරිස්තුමා විසින් නියම කරනු ලබන ආකෘති පත්‍රයට අනුකූලවන සේ අයවැය ලේඛණය ඉදිරිපත් කළ යුතුය.
	• අයවැය ලේඛණයට පහත දැක්වෙන කරුණු ඇතුලත් විය යුතුය.
	    • යෝජිත වියදම් පිළිබඳ විස්තරය නිසි වැය ශීර්ෂ යටතේ විෂය අංක සහිතව ඉදිරිපත් කළ යුතුය.
	    • වරිපනම් බදු නොවන ප්‍රභවයන්ගෙන් සභාවට ලැබෙන ආදායම් පිළිබඳ ඇස්තමේන්තුවක්
	    • යෝජිත වියදම් සඳහා විධිවිධාන සැලැස්වීමේ කාර්යය සඳහා අවශ්‍යය වරිපනම් බදු හෝ බදු පිළිබඳ ආදායම් ඇස්තමේන්තුවක්.

178 (2) වගන්තිය	(II) පරිපූරක අයවැය ඉදිරිපත් කිරීම යම් වර්ෂයක අලුත් වැය විෂය අංකයක් යටතේ හෝ විෂය අංක ඉදිරිපත් කිරීමට අවශ්‍යය කවර විටක වුවද සභාපතිවරයා විසින් යෝජිත වියදමේ විස්තර ඇතුලත් පරිපූරක අයවැය ලේඛණයක් පිළියෙල කර සභාවට ඉදිරිපත් කළ යුතුය.

178 (3) වගන්තිය	නගර සභාවක සෑම වාර්ෂික අයවැය හෝ පරිපූරක අයවැය ලේඛණයක ම පිටපතක් පරීක්ෂා කිරීම සඳහා නගර සභා කාර්යාලයේ තැබිය යුතුය.
178 (අ) වගන්තිය	(IV) අයවැය ලේඛණය සභාව විසින් සලකා බැලීම හා ඒ පිළිබඳව සභාපතිතුමා සතු බලතල අයවැය ලේඛණයක හෝ පරිපූරක අයවැය ලේඛණයක සියලුම විෂයන් හෝ ඉන් යම් විෂයක් සභාව විසින් •සුළු වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් හෝ •ඊට යම් විෂයක් එක් කරනු ලැබුවහොත් හෝ •සභාවේ මෙවැනි තීරණයකට සභාපතිවරයා විසින් එකඟ නොවන්නේ නම් •සභාපතිවරයා විසින් ඒ අයවැය ලේඛණය හෝ පරිපූරක අයවැය ලේඛණය තවදුරටත් සලකා බැලීම සඳහා සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතුය

<u>ප්‍රාදේශීය සභා</u>

නෛතික විධාන	අදාල කාර්යයන්
ප්‍රාදේශීය සභා පනත 168 (1) වගන්තිය	(1) වාර්ෂික අයවැය ඉදිරිපත් කිරීම •සෑම ප්‍රාදේශීය සභාවකම සභාපතිවරයා විසින් සෑම වර්ෂයකම ඊළඟ වර්ෂය සඳහා අයවැය ලේඛණයක් සකස් කළ යුතුය. •එම අයවැය ලේඛණය සභාවට ඉදිරිපත් කළ යුත්තේ සභාපතිවරයා විසිනි. •ප්‍රාදේශීය සභා රීතිවලින් නියම කර ඇති දිනයක හෝ ඊට පෙර දිනයක අයවැය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. •අයවැය ලේඛණය ඉදිරිපත් කළ යුත්තේ රීති වලින් නියමිත ආකෘති පත්‍රයේ ආකාරයටය. •අයවැය ලේඛණයට පහත දැක්වෙන කරුණු ඇතුලත් විය යුතුය ඉදිරි වර්ෂය සඳහා සභාවට අයවිය යුතු ආදායම් ඇස්තමේන්තුවක් ඉදිරි වර්ෂය සඳහා යෝජිත වියදම් ඇස්තමේන්තුවක්

168 (3) වගන්තිය	පරිපූරක අයවැය ඉදිරිපත් කිරීම අවශ්‍ය ඕනෑම අවස්ථාවක සභාපතිවරයා විසින් පරිපූරක අයවැයක් සකස් කර සභාවට ඉදිරිපත් කළ හැකිය.
168 (4) වගන්තිය	111) සභාව විසින් අයවැය සලකා බැලීම • අයවැය අදාල වර්ෂය ආරම්භවීමට පෙර සභාව විසින් අයවැය සලකා බලා අවශ්‍යය සංශෝධන ඇත්නම් ඒවා සමඟ අනුමත කළ යුතුය. • එම අවස්ථාවේ සභාවට පහත දැක්වෙන පියවර ගත හැකිය.අයවැයේ අඩංගු කරුණු සියල්ලම හෝ කොටසක් - සම්මත කිරීම - සංශෝධනය කිරීම - අයවැයට හෝ පරිපූරක අයවැයට යම් කරුණු එකතු කිරීම හෝ - ප්‍රතික්ෂේප කිරීම
169 වගන්තිය	සභාව, අයවැය ලේඛණයේ හෝ පරිපූරක අයවැය ලේඛණයේ අංඩගු කරුණු සියල්ලම හෝ කොටසක් සංශෝධනය කරයි නම් හෝ ප්‍රතික්ෂේප කරයි නම් හෝ එයට යම් කොටසක් එකතු කරයි නම්, සභාවේ එවැනි තීරණයකට සභාපතිවරයා එකඟ නොවන්නේ නම් සභාපතිවරයා එම අයවැය ලේඛණය හෝ පරිපූරක අයවැය ලේඛණය තවදුරටත් සලකා බැලීමට නැවත සභාවට ඉදිරිපත් කළ යුතුය.

(ආශ්‍රිතය; පළාත් පාලන ප්‍රතිසංස්කරණ අත්පොත් අංක 04)

<u>සේවා විශ්ලේෂණ ක්‍රියාවලිය 4</u>

ව්‍යාපෘතියක් විශ්ලේෂණය කිරීමට සහ අන්තර්කරණය සහතික කිරීමට මෙවලමක් ලෙස සේවා විශ්ලේෂණ ක්‍රියාවලිය භාවිතා කළ හැකිය. අවශ්‍යතා තක්සේරු කිරීමට සහ පිළිගත හැකි විසඳුම් සොයා ගැනීමට සෑම සේවා ප්‍රදේශයක්ම විශ්ලේෂණය කළ හැකිය. සෑම ව්‍යාපෘතියක්ම සවිස්තරාත්මක ප්‍රවේශයන් සමඟ සංවර්ධනය කළ පසු, එය වාර්ෂික අයවැය යෝජනාවේ පවරා ඇති සේවා ක්ෂේත්‍රය යටතේ පිළිබිඹු වන මූලා අයවැය සමඟ පළාත් පාලන ආයතනයේ වාර්ෂික වැඩ සැලැස්මට ඇතුළත් කළ හැකිය. හඳුනාගත් ව්‍යාපෘති සාර්ථකව සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සේවා වැඩිදියුණු කිරීමේ සැලසුම් සැකිල්ල මඟින් සපයනු ඇත.

පළාත් පාලන හවුල්කරුවන්ට කාන්තාවන්ට සහ ආන්තික කණ්ඩායම්වලට ඇතැම් නාගරික සේවාවන් සඳහා ඇති ඇතුළත් කිරීමේ මට්ටම, ප්‍රවේශය සහ ගුණාත්මකභාවය විශ්ලේෂණය කිරීමට උපකාර කිරීම සඳහා ප්‍රාදේශීය නායිකාවන් ශක්තිමත් කිරීම තුළින් පළාත් පාලන සේවාවන් නව්‍යකරණය කිරීමේ ව්‍යාපෘතිය (PMI-WILL) යටතේ සේවා විශ්ලේෂණ මෙවලම සකස් කරන ලදී. සියලුම සේවා වැඩිදියුණු කිරීම් සාධාරණ, ඇතුළත් සහ අඩු නියෝජනයක් සහිත ප්‍රජාවන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන බව සහතික කිරීම සඳහා එය ව්‍යුහගත ප්‍රවේශයක් සපයයි.

ප්‍රමුඛතා සේවා ක්ෂේත්‍රය - 1

1. සේවා විශ්ලේෂණ සොයාගැනීම්

මෙම සේවා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රධාන සොයාගැනීම් මොනවාද? හොඳින් ක්‍රියාත්මක වන දේ සහ වැඩිදියුණු කළ යුතු දේ ඉස්මතු කිරීමට වග බලා ගන්න.

පාර්ශ්වකරුවන්ගේ කාණ්ඩ (උදා: - කාන්තාවන්, තරුණ ගැහැණු ළමයින්, ආබාධිත පුරවැසියන්, රාජ්‍ය ක්‍රියාකාරීන් ආදිය...)	පවත්නා සේවාව පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිපෝෂණ (උදා: - ක්‍රීඩා පිටිය, පොදු උද්‍යානය, පොදු වෙළඳපොළ, පොදු වැසිකිළිය, පොදු පුස්තකාලය, ආදිය...)	ඉල්ලුම් පහසුකම්	ඉස්මතු කළ ප්‍රතිලාභ

- **මෙම සේවාවට හදිසි අවධානයක් අවශ්‍ය වන්නේ ඇයි?**

2. යෝජිත විසඳුම

- සේවා සැපයීමේ වත්මන් පරතරය පියවා ගැනීමට ඇති යෝජනාව කුමක්ද?

පවතින පරතරය	පියවීම සඳහා විසඳුම

[4] *ප්‍රාදේශීය නායිකාවන් ශක්තිමත් කිරීම තුළින් පළාත් පාලන සේවාවන් නව්‍යකරණය කිරීමේ ව්‍යාපෘතිය (PMI-WILL) යටතේ සකස් කරන ලදි*

- මෙම විසඳුම සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කරන්නේ කෙසේද? මෙම යෝජිත විසඳුම සාර්ථක වීමට නම් එය කෙබඳු වනු ඇත්ද?

විසඳුම	**විසඳුම හරහා වැඩිදියුණු වන නිශ්චිත සේවා ගුණාත්මකභාවය**

- විසඳුම ස්ත්‍රී පුරුෂ භාවය අනුව ප්‍රතිචාරාත්මක සහ ඇතුළත් වන්නේ කෙසේද? ප්‍රජාව තුළ කාන්තාවන්ට සහ ආන්තික කණ්ඩායම්වලට ලැබෙන නිශ්චිත ප්‍රතිලාභ මොනවාද?

3. අයවැය සහ ක්‍රියාත්මක කිරීම

- යෝජිත විසඳුමේ ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද?

විස්තරය	ප්‍රමාණය	ඒකක පිරිවැය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය

- යෝජිත විසඳුම තිරසාර වන්නේ කෙසේද?

- යෝජිත විසඳුම ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන ආයතනවලට ඇති බලතල තුළ තිබේද?

විෂය පථය	**නෛතික ප්‍රතිපාදන**

4. ඉලක්කගත දිනය

- යෝජිත විසඳුම සම්පූර්ණ කිරීම සඳහා කාල නියමය කුමක්ද?
- පළාත් පාලන ආයතනයේ පාලනයෙන් පිටත සාධක මගින් කාලසීමාවන් සාධාරණද නැතහොත් සීමා කර තිබේද?

5. මහජන සහභාගීත්වය

- යෝජිත විසඳුම සංවර්ධනය කිරීමේදී බාහිර පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් සම්බන්ධ වී සිටියාද?

ඔව් නම්, බාහිර පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් 5ක් දක්වා සහ ඒවායේ කාර්යභාරය දක්වන්න:

FSLGA

FEDERATION OF SRI LANKAN
LOCAL GOVERNMENT AUTHORITIES

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය